# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 145 — 1975 ජනවාරි 03 වැනි සිකුරාද — 1975.01.03

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... | 3 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 1 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | 2 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා ජනරජයේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශන ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආදායම් සහ වියදම් වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 3 | විවිධ දෙපාර්තමේන්තුවේ දැන්වීම් ... ... ... | 6 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... | — |


සැ. යු.—කොළඹ පහයන නැව් කටාකය හා පෝටන්ට් ලීස්සුම් මග පිළිබඳ ආඥාපනත ඉවත් කිරීම් පනත් කෙටුම්පත; ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත් කෙටුම්පත සහ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 1974 දෙසැම්බර් 27 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

**1975 අංක 1**

අංකය: ඩී. 23/ආර්ජිසීඑෆ්/196

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

1975 ජනවාරි මස 01 වන දින සිට පහත නම් සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ප්ලයිට් ලෙප්ටිනන්ට් (තාවකාලික ස්කොඩ්රන් ලීඩර්) ඕ.එම්. පෝල් (01079) පො.රු./නියමු

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. ඩී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1974 දෙසැම්බර් 26 දින,
කොළඹදීය.

1–217—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1974 ජනවාරි මස 1 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත් කිරීම් ආදිය

**1975 අංක 2**

අමප. 26/74 අධි.සේ.උ. 4.

1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ පනතේ 29 වෙනි වගන්තිය සමග කියවිය යුතු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (1) වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් පහත දක්වෙන අය 1974 නොවැම්බර් මස 01 වෙනි දින සිට මහේස්ත්‍රාත් ධුරයට පත් කර ඇත.

අරුලම්පලම් කෙන් ගාදරන්

ඩිංගිරි බණ්ඩාර ඇල්ලෙපොල

ජිමි මහේන්ද්‍ර සිරිවර්ධන සමරවීර

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 29 වෙනි දින.

1–12/3—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 3**

අංකය : අමප. 231/74. අධිසේ උ. 15.

අමාත්‍ය මණ්ඩලය විසින්, කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ඒ. එස්. විජේතුංග මහතා, ශ්‍රී ලංකා අධිකරණ සේවයෙහි නිලධාරියෙකු වශයෙන්, ස්වකීය පත්වීමෙහි 1971 ජූනි මස 15 වන දින සිට ස්ථිර කර ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 15 වන දින.

1–12/6—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 4**

අමප. 467/1974 අධිසේ උ. 34.

අමාත්‍ය මණ්ඩලය විසින්, ඒ. එම්. අයි සහීඩ් මහතා ගම්බද උසාවි සභාපතිවරයෙකු වශයෙන් ස්වකීය පත්වීමෙහි 1973 සැප්තැම්බර් මස 28 වෙනි දින සිට ක්‍රියාත්මක වන සේ ස්ථිර කර ඇත.

ජේ. ඩී. ආරියසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ වැඩ බලන ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1.
1974 නොවැම්බර් මස 12 වන දින.

1–12/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 5**

අමප. 360/74 අධි.සේ.උ. 23.

**ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් කර ඇති පත් කිරීම්**

ගාල්ල, රිච්මන්ඩ් කන්ද පාරේ, අංක 28 හි පදිංචි එස්. ඒ. එම්. ෆාරුක් මහතා ගාල්ල සහ බලපිටිය පැවති අධිකරණ කොට්ඨාශයේ කාතිවරයා වශයෙන් 1974 ඔක්තෝබර් මස 04 වෙනි දින සිට තුන් අවුරුදු කාලසීමාවකට හෝ නැවත නියමයක් කරන තුරු පත් කර ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 03 වන දින.

1–12/8—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 6**

අමප. 359/74 අධි.සේ.උ. 22.

**ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් කර ඇති පත් කිරීම්**

රත්නපුර, ඇතුල් රවුම් පාරේ අංක 16/ජේ හි පදිංචි ඒ. ඇල්. ඒ. සමීම් මහතා, රත්නපුර පැවති අධිකරණ කොට්ඨාශයේ කාතිවරයා වශයෙන්, 1974 අගෝස්තු මස 05 වැනි දින සිට තුන් අවුරුදු කාල සීමාවකට හෝ නැවත නියමයක් කරන තුරු පත්කර ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 03 වන දින.

1–12/7—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**1975 අංක 7**

අමප. 379/74 අධිසේ උ. 29.

**ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් කර ඇති පත් කිරීම්**

නාවලපිටිය කන්ද පාරේ, අංක 31 හි පදිංචි, ඒ. එල්. ඒ. ගෆූර් මහතා මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ආදායම් කොට්ඨාශය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හපුගස්තලාව ග්‍රාමය සඳහා කාතිවරයා වශයෙන් 1974 ඔක්තෝබර් මස 13 වැනි දින සිට තුන් අවුරුදු කාල සීමාවකට හෝ නැවත නියමයක් කරන තුරු පත් කර ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 15 වන දින.

1–12/5—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

අංකය : අමප. 362/1974. අධි.සේ.උ. 25.

කුරුණෑගල මහේස්ත්‍රාත් එන්. බී. ඩී. එස්. විජේසේකර මහතා 1974 සැප්තැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මහේස්ත්‍රාත් ධුරයෙන් ඉල්ලා අස්වී ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 15 වන දින.

1–12/9—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

අමප. 378/1974. අධිසේ උ.28.

**හම්බන්තොට කාති තනතුරෙන් ඉල්ලා අස්වීම**

හම්බන්තොට ටෙරස් ස්ට්‍රීට් හි අංක 19 හි පදිංචි ඒ. එල්. එම්. රෂීන් මහතා, 1974 අගෝස්තු මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, හම්බන්තොට කාති තනතුරෙන් ඉල්ලා අස්වී ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 14 වන දින.

1–12/4—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

අමප. ආ. 129/72 අධිසේ උ. 5.

**දකුණු කොළඹ කාති තනතුරෙන් ඉල්ලා අස්වීම**

කොළඹ 6, දොස්තර ඊ. ඒ. කූරේ මාවතේ අංක 34 හි පදිංචි ඉසඩ්. ඒ. එම්. නාසිම් මහතා, 1974 ඔක්තෝබර් මස 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, දකුණු කොළඹ කාති තනතුරෙන් ඉල්ලා අස්වී ඇත.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1.
1974 ඔක්තෝබර් මස 31 වන දින.

1–12/2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

# වෙනත් පත් කිරීම් ආදිය

**1975 අංක 8**

අංකය : ඊබී/ඒ—3.

පහත සඳහන් පත්වීම් කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා සතුටු වී ඇත :—

බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත ෂී. බී. පිහිල්ලෙගෙදර මහතා, 1974 සැප්තැම්බර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව බදුල්ල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැව්රොල් ආඥපනත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

අම්පාර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත ඩබ්ලිව්. කේ. ඒ. පී. පී. අබේසිංහ මහතා, 1974 ඔක්තෝබර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව අම්පාර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැව්රොල් ආඥපනත යටතේ ප්‍රාදේශීය අධිකාරි.

ඩී. බී. අයි. පී. එස් සිරිවර්ධන,
ලේකම්.

1974 දෙසැම්බර් මස 05 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1-2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

**1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා පනත**
**10 වගන්තිය යටතේ නියමය**

**1970** අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ සංස්ථා පනතේ 10 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙම නියමයෙන්, අංක 55/1 සහ 1973.04.12 දා ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද ආණ්ඩුවේ නිවේදනයේ 2 වන උපලේඛණය යටතේ දක්වෙන සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික වාල්ස් අබේසේකර මහතා වෙනුවට ගල පිටගේ සේන දයානන්ද මහතා පත් කරමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1974. 12. 16 වැනි දින.
කොළඹ දී ය.

1-211—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**ගැසට් නිවේදනය**

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත ඇමති වශයෙන් මගේ ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1974.11.09 දින සිට 1976.10.09 දින දක්වා නිල වශයෙන් වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ කොමසාරිස් ධුරයේ රාජකාරී කරන කාලය තෙක්, රාජ්‍ය රබර් නිෂ්පාදන සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ඒ. එෆ්. එස්. වීරසේකර මහතා පත් කර ඇති බැව් මෙයින් දැනුම් දෙමි.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
අංක 6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 1.

1-131—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

**ආඥාව**

**ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—**

(අ) 1974 ජූලි මස 19 වැනි දින අංක 121 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතේ වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 18 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පිහිටි දීගල්ල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) දීගල්ල පදිංචි රාමනායක මුදියන්සේලාගේ කිරිමුදියන්සේ මහතා
(2) දීගල්ල පදිංචි ආරියසිංහ රාමනායක මහතා
(3) දීගල්ල පදිංචි නවරත්න මුදියන්සේලාගේ දයාරත්න මහතා
(4) දීගල්ල, ඉහල එලතලව පදිංචි කිරිහාමි ලේකම්ලාගේ තෝබට් කරුණාරත්න මහතා
(5) දීගල්ල, පහල එලතලව පදිංචි හිටිහාමි මුදියන්සේලාගේ විමල් මහතා
(6) දීගල්ල, පහල එලතලව පදිංචි රන්දුනු පතිරන්නැහැලාගේ මැණික්රාල මහතා
(7) දීගල්ල, පහල එලතලව පදිංචි උපාසක ලේකම්ලාගේ විජේසේන මහතා
(8) කුලියාපිටිය, වීරඹුව පදිංචි විජේනායක මුදියන්සේලාගේ ජේම්ස් සිංඤෝ මහතා
(9) කුලියාපිටිය, වීරඹුව පදිංචි හේරත් මුදියන්සේලාගේ ජයතිලක් මහතා
(10) ඉළුක්හේන, කොස්හේන පදිංචි මල්ලව ආරච්චිගේ මර්තේලිස් අප්පුහාමි මහතා
(11) ඉළුක්හේන, බෝහන්දිය පදිංචි හේරත් මුදියන්සේලාගේ මැණික්රාල මහතා
(12) ඉළුක්හේන, ගල්පොල පදිංචි කළුපහන කරුණාතිලක එදිරිමුනු ආරච්චිලාගේ එච්ලින් සිංඤෝ මහතා
(13 කුලියාපිටිය, කුරුදල්පොත පදිංචි හේරත් මුදියන්සේලාගේ සුනිල් ප්‍රේමසිරි මහතා
(14) කුලියාපිටිය, කුරුදල්පොත ‘ජයබිම’ හි පදිංචි හේරත් මුදියන්සේලාගේ ජයසේන හේරත් මහතා
(15) ඉළුක්හේන, බොරුවැව පදිංචි සත්කුමාර මුදියන්සේලාගේ කිරිමුදියන්සේ මහතා
(16) ඉළුක්හේන, බෙරුවැව පදිංචි හෙට්ටිනායක මුදියන්සේලාගේ කරුණාරත්න මහතා
(17) ඉළුක්හේන, වෙදගෙදර කුඹල්වල පදිංචි අබේකෝන් මුදියන්සේලාගේ කිරිබණ්ඩා මහතා
(18) ඉළුක්හේන, මීනැව, ‘සරසවි’ හි පදිංචි හේරත් මුදියන්සේලාගේ ටිකිරිබණ්ඩා හේරත් මහතා
(19) කුලියාපිටිය, ඇඹව පදිංචි සියඹලා පිටියගේ දොන් ප්‍රේමරත්න මහතා
(20) ඉළුක්හේන, වස්සාවුල්ල පදිංචි මල්ලවආරච්චිගේ සිරිසේන මහතා

(21) ඉළුක්හේන, දික්හැර පදිංචි චන්ද්‍රසේකර තෙන්න කෝන් මුදියන්සේලාගේ අප්පුහාමි මහතා

(22) දිගල්ල, බෝගොඩ පදිංචි තෙලිසිංහ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා

(23) දිගල්ල, ගල්සොළ පදිංචි විදානෙලාගේ ජෝන් සිංඤෝ මහතා

(24) කුලියාපිටිය, ගයියාල, 'තිලකනිවස' පදිංචි රත්නායක මුදියන්සේලාගේ ජයතිලක මහතා

(25) දිගල්ල, කබලෑව පදිංචි රාජපක්ෂ අධිකාරි මුදියන්සේලාගේ අප්පුහාමි මහතා

(26) කුලියාපිටිය, ඇඹව පදිංචි රණතුංග මුදලිගේ අලිසන්ද්‍රි අප්පුහාමි මහතා

(27) උඩුබද්දාව, මඩකුඹුරුමුල්ල පදිංචි දසනායක හිරි හාමිල්ලාගේ ආයුපාල දසනායක මහතා

(28) උඩුබද්දාව, මඩකුඹුරුමුල්ල පදිංචි උඩුවිල ආරච්චිලාගේ විමලහාමි මහතා

(ආ) දිගල්ල පදිංචි රාම්නායක මුදියන්සේලාගේ කිරිමුදියන්සේ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1974 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1–148—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතෙහි පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1974 ජූලි මස 19 වැනි දින අංක 121 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 44 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මඩකලපුව දිස්ත්‍රික්කය තුල පිහිටි කාත්තාන්කුඩි සුළු නගර සභා ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) කාත්තාන්කුඩි 'සිගරවාස' හි පදිංචි ස්මාලෙබ්බෙ මොහමඩ් ඉබ්‍රාහිම් මහතා

(2) කාත්තාන්කුඩි කොටස් 6 හි පදිංචි මොහිදීන් බාවා කච්චිමොහමඩ් මීරා සාහිබ් මහතා

(3) කාත්තාන්කුඩි කොටස් 2 හි පදිංචි අලියාර්ලෙබ්බෙ අහමඩ්ලෙබ්බෙ මහතා

(4) කාත්තාන්කුඩි කොටස් 1 හි පදිංචි අහමඩ් මොහිදීන් මොහමඩ් ඉබ්‍රාහිම් මහතා

(5) කාත්තාන්කුඩි 5 වැනි කොටසේ පදිංචි මොහමඩ් ඉබ්‍රාහිම් මොහමඩ් කාසිම් හාජ්ජියාර් මහතා

(6) කාත්තාන්කුඩි කොටස් 7 හි පදිංචි මොහිදීන් බාවා හාජ්ජියාර් අබ්දුල් මජීඩ් හාජ්ජියාර් මහතා

(7) කාත්තාන්කුඩි කොටස් 7 හි පදිංචි මොහමඩ් ස්මායිල් හාජ්ජියාර් නූර් මොහමඩ් හාජ්ජියාර් මහතා

(8) කාත්තාන්කුඩි කොටස් 2 හි පදිංචි අලියාර් ලෙබ්බෙ ජවාත් මහතා

(9) කාත්තාන්කුඩි 3 වැනි කොටසේ පදිංචි මොහමඩ් ඉස්මායිල් හාජ්ජියාර් සින්නලෙබ්බෙ මහතා

(10) කාත්තාන්කුඩි 3 වෙනි කොටසේ පදිංචි අහමඩ් ලෙබ්බෙ අබ්දුල් රහීම් මහතා

(11) කාත්තාන්කුඩි 'තාරුස් සලාම්' හි පදිංචි අහමඩ් ලෙබ්බෙ මොහමඩ් ස්මායිල් හාජ්ජියාර් මහතා

(12) කාත්තාන්කුඩි 5 වැනි කොටසේ පදිංචි අබ්දුල් කාපූර් අබූබකර් මහතා

(13) කාත්තාන්කුඩි කොටස් 5 හි පදිංචි මොහමඩ් මුස්තාපා මොහමඩ් මවුරූෆ් කාසිම් මහතා

(14) කාත්තාන්කුඩි කොටස් 4 හි පදිංචි සීනි මොහමඩ් අහමඩ් මොහිදීන් මහතා

(15) කාත්තාන්කුඩි කොටස් 4 හි පදිංචි මොහමඩ් රෂීඩ් මොහමඩ් ෆාරූක් මහතා

(16) කාත්තාන්කුඩි 3 වැනි කොටසේ පදිංචි මොහමඩ් මුස්තාපා මොහමඩ් සහබ්දීන් මහතා

(17) කාත්තාන්කුඩි 3 වැනි කොටසේ පදිංචි ඔමර්දීන් අබ්දුල් රහුමාන් මහතා

(18) කාත්තාන්කුඩි කොටස් 2 හි පදිංචි අබ්දුල් කාදර් මොහමඩ් මීරාසාහිබු හාජ්ජියාර් මහතා

(19) කාත්තාන්කුඩි 6 වැනි කොටසේ පදිංචි මනුමුදු ලෙබ්බෙ නූර් මොහමඩ් මහතා

(20) කාත්තාන්කුඩි 6 වැනි කොටසේ පදිංචි කාජි අලියාර් අහමඩ් මොහිදීන් මහතා

(21) කාත්තාන්කුඩි 6 වැනි කොටසේ පදිංචි උමර්ලෙබ්බෙ උදුමා ලෙබ්බෙ මහතා

(22) කාත්තාන්කුඩි 4 වැනි කොටසේ පදිංචි මොහමඩ් ස්මායිල් හාජ්ජියාර් අහමඩ් මොහිදීන් හාජ්ජියාර් මහතා

(23) කාත්තාන්කුඩි 2 වැනි කොටසේ පදිංචි මීරාසාහිබ් මොහමඩ් මුස්තාපා මහතා

(24) කාත්තාන්කුඩි 'තාරුල් අමාන්' හි පදිංචි මහමූදු ලෙබ්බෙ ආලිම් මොහමඩ් ස්මායිල් මහතා

(25) කාත්තාන්කුඩි 4 වැනි කොටසේ පදිංචි මොහමඩ් අබ්දුල් කාදර් සෙයියදු අහමඩ් මහතා

(26) කාත්තාන්කුඩි 3 වැනි කොටසේ පදිංචි මොහිදීන් අබ්දුල් කාදර් ආදම්ලෙබ්බෙ හාජ්ජියාර් මහතා

(27) කාත්තාන්කුඩි 3 වැනි කොටසේ පදිංචි සේගු මදාර් ආදම්බාවා මහතා

(ආ) කාත්තාන්කුඩි, 'සිගරවාස' හි පදිංචි ස්මාලෙබ්බෙ මොහමඩ් ඉබ්‍රාහිම් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1974 දෙසැම්බර් මස 13 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

1–149—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 7අ වගන්තිය යටතේ නිවේදනය

1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 7අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍ය නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙහිවූ උපලේඛනයෙහි I වන තීරුවෙහි අනුරූප සටහනෙහි නිශ්චිතව සඳහන් තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් පවත්වාගෙන යනු ලබන මෙහිවූ උපලේඛනයෙහි II වන තීරුවෙහි නිශ්චිතව සඳහන් එක් එක් ව්‍යාපාරය එකී වගන්තියේ කාර්යයක් සඳහා අනුමත ව්‍යාපාරයක් බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1974 දෙසැම්බර් 18 දා,
කොළඹ දීය.

#### උපලේඛනය

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සීමාසහිත සිලෝන් මැරයින් ප්‍රඩක්ට්ස්. | මාළු, බෙල්ලන්, පොකුදැල්ලන් ආදිය පිරියම් කිරීම සඳහා විකිණීම හෝ අපනයනය කිරීම සඳහා වන ව්‍යාපාරය. |
| 2. රාජ්මාක්-සෆිබෝ සහ සමාගම. | ශාක පදම්කල හරක් සම්, ම් හරක් සම් සහ එළුසම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ අපනයනය කිරීම සඳහා වන ව්‍යාපාරය. |
| 3. මුනා අනමූනා අබ්දුල් කාදර් සහ සමාගම. | පදම් කළ හරක් සම්, පදම් කළ මීහරක් සම් සහ පදම්කළ එළුසම් නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ අපනයනය කිරීම සඳහා වන ව්‍යාපාරය. |
| 4. සීමාසහිත රවි ඉන්ඩස්ට්‍රීස්. | බුරුසු සහ කොසු නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ අපනයනය කිරීම සඳහා වන ව්‍යාපාරය. |
| 5. සීමාසහිත යුනි-වෝකර්ස්. | ශීතකළ ඉස්සන්, පොකිරිස්සන් සහ අනිකුත් මාළු පිරියම් කිරීම සහ විකිණීම හෝ අපනයනය කිරීම සඳහා වන ව්‍යාපාරය. |

1-157/1—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 10 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යැයි කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන යෝජනා ක්‍රමයන් වූ, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් නව කාර්මික ව්‍යාපාර ඉහතකී 10 වැනි වගන්තියේ (5) වැනි උපවගන්තියේ කාර්යයන් සඳහා අනුමත යෝජනා ක්‍රම ලෙස කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙයින් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1974 දෙසැම්බර් 18 දා,
කොළඹ දීය.

#### උපලේඛනය

| කාර්මික යෝජනා ක්‍රමයේ විස්තර | නව කාර්මික ව්‍යාපාරයේ නම |
|---|---|
| 1. නයිලෝන් මේස් සහ දිග මේස් නිෂ්පාදනය කිරීම සඳහා වන යෝජනා ක්‍රමය. | සීමාසහිත ජයලංකා ඉන්ඩස්ට්‍රීස්. |
| 2. කඩදාසි ඉඳුල්කඩ සහ අත් ලේන්සු නිෂ්පාදනය කිරීම සඳහා වන යෝජනා ක්‍රමය. | සීමාසහිත සිලෝන් පේපර් ප්‍රඩක්ට්ස් සමාගම. |
| 3. මෝටර්රථ අමතර කොටස් සහ යන්ත්‍රෝපකරණ අංගෝපාංග නිෂ්පාදනය කිරීම සඳහා වන යෝජනා ක්‍රමය. | සීමාසහිත මිකැනිකල් සහ ප්‍රෙසිෂන් එන්ජිනියර්ස්. |

1-157/2—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 16ඇ වැනි වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16ඇ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යැයි කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා විසින් සලකනු ලබන ව්‍යාපාරය වන මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් වන කාර්මික ව්‍යාපාරය, ඉහතකී වගන්තියේ කාර්යයන් සඳහා අනුමත ව්‍යාපාරයක් වශයෙන්, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙයින් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1974 දෙසැම්බර් 18 දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

| කාර්මික ව්‍යාපාරයේ විස්තරය | නව කාර්මික ව්‍යාපාරයේ නම |
|---|---|
| මෝටර් රථ අමතර කොටස් සහ යන්ත්‍රෝපකරණ අංගෝපාංග නිෂ්පාදනය කිරීම සඳහා වන ව්‍යාපාරය. | සීමාසහිත මිකැනිකල් සහ ප්‍රෙසිෂන් එන්ජිනියර්ස්. |

සටහන :

1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16ඇ වන වගන්තිය යටතේ දිමනාවක් දෙනු ලබන්නේ 1973 මාර්තු 31 වන දින හෝ ඊට පෙර කරන ලද ආයෝජන සඳහා පමණි.—1972 අංක 17 දරන දේශීය ආදායම් සංශෝධන පනතේ 6 වන වගන්තිය බලන්න.

1-157/3—75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

### 69 වගන්තිය යටතේ දැන්වීම

1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 69 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ජනරජයේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍යයයි කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර අමාත්‍යවරයා විසින් සලකනු ලබන යෝජනා ක්‍රමයක් වන මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කාර්මික ව්‍යාපාරය, ඉහතකී වගන්තියේ කාර්යයන් සඳහා අනුමත ව්‍යාපාරයක් වශයෙන් කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර අමාත්‍යවරයාගේ ඉල්ලීම පරිදි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1974 දෙසැම්බර් 18 දින,
කොළඹ දීය.

#### උපලේඛනය

| කාර්මික යෝජනා ක්‍රමයේ විස්තර | නව කාර්මික ව්‍යාපාරයේ නම |
|---|---|
| රෙයොන් සහ කෘතිම රෙදි නිෂ්පාදනය. | සී/ස. ක්ලිප්ටෙක්ස් සමාගම. |

1-157/4—75.10.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : සී/අයි. 19.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය, අංක : 9, ඩී මැල් වීදිය, කොළඹ 2 සහ වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) ලිමිටඩ්, තැ. පෙ. 166, කොළඹ, අතර කාර්මික ආරවුලක් පවතී.

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14, අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල නිරවුල් කිරීම සඳහා එම පනතේ 22 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන්නාවූ කාර්මික අධිකරණයක් වෙත යොමු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1974 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹදීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය, අංක : 9, ඩී, මැල් වීදිය, කොළඹ 2 සහ වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) ලිමිටඩ් තැ. පෙ. 166, කොළඹ

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය විසින් වෝකර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) ලිමිටඩ්හි සේවය කරන තම සාමාජිකයන් වෙනුවෙන් කරන පහත සඳහන් ඉල්ලීම් යුක්ති සහගතද යන්න හා එසේ නම් සංගමයේ එකී සාමාජිකයන්ට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව වේ.

1. දෙවන හා තුන්වන වාර වැඩ කිරීම සඳහා එක් සේවකයෙකුට දිනකට රුපියල් 2 බැගින් වාර වැඩ සඳහා දීමනාවක් ගෙවීම.
2. නිළ ඇඳුම් වෙනුවට එක් එක් සේවකයාට නිළ ඇඳුම් දීමනාවක් ගෙවීම.
3. එක් එක් සේවකයාට මාස දෙකක දළවේතන වාර්ෂික ප්‍රසාද මුදල් වශයෙන් ගෙවීම.
4. පළමු ඉල්ලීම් දෙක සම්බන්ධයෙන් 71.1.1 දින සිට වලංගුවන පරිදි ගෙවීම් කරන ලෙස බේරුම්කරු විසින් නියෝග කළ පරිදි ඉහත කී සියලුම ඉල්ලීම් පිළිබඳව හිඟ මුදල් ගෙවීම.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1974 දෙසැම්බර් මස 11 වැනිදා වූ මෙදින
කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

1-207 —75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ප්‍රදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය-වයඹ දිසාව කුලියාපිටිය කොට්ඨාශය**

කඩහපොල-රඹාවැව මාර්ගයේ 5 වන සැතපුමේ පොල්පිටිය වැවේ වැඩ සඳහා පාර ඉස්සීම.

2. ඉහත සඳහන් වැවේ වැඩට පාර ඉස්සීම සඳහා 1974.11.28 දින සිට නැවත දන්වන තුරු සියළුම වාහන ගමනාගමනයට වසා තබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

3. වසා තබන මෙම මාගීය වෙනුවට පහත සඳහන් වෛකල්පික මාර්ගයන් යොදා ගත හැකිය.

1. කුලියාපිටිය-මුණමල්දෙණිය පාර හරහා කටුපොත.
2. කුරුණෑගල-මහකෙළිය පාර හරහා කටුපොත.

ඇම්. ආර්. ප්‍රනාන්දු,
වැඩ අධ්‍යක්ෂ වයඹ දිසාව.

1-106 —75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් E 111 L 4 දරණ මුද්‍රාමිටිය සහ F D 153a දරණ ඇල් බලපත්‍ර පොත අංක 005572 සිට 005670 දක්වා පිටු සහිතව දකුණු දිසාවේ හම්බන්තොට අඩවියේ කුරුදාන වන රක්ෂකගේ භාරයෙන් නැතිවී ඇති බව ලංකාණ්ඩුවේ හා මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

ඉහත සඳහන් මුද්‍රා මිටි ලකුණු දරණ දැව ප්‍රවාහනය කිරීම, මිළදී ගැනීම, ළඟ තබා ගැනීම හෝ ඉහත සඳහන් අංක දරණ බලපත්‍ර පාවිච්චි කිරීම වන ආඥාපනතේ 451 වන ඡේදය සහ දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඩුවම් දිය හැකි වරදක් බව මහජනයාට මෙයින් අවවාද කරණු ලැබේ.

වී. ආර්. නානායක්කාර,
වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 509, කොළඹ 2.
74.12.23.

1-150 —75.01.03 දින අංක 145 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා වේ.

4. මුදල් ගණුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැළකිය යුතුයි.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ,** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | | පිටරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය,**

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ | | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|---|
| | රු. | ශ. | | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | ... | 0 | 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රය පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුලත් වෙනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | ... 03.01.75 | සිකුරාද | ... 27.12.74 | සිකුරාද | දවල් 12.00 |
| | 10.01.75 | සිකුරාද | ... 03.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 17.01.75 | සිකුරාද | ... 10.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.01.75 | සිකුරාද | ... 17.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 31.01.75 | සිකුරාද | ... 24.01.75 | සිකුරාද | දවල් 12.00 |
| පෙබරවාරි | ... 07.02.75 | සිකුරාද | ... 31.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.02.75 | සිකුරාද | ... 07.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.02.75 | සිකුරාද | ... 14.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 28.02.75 | සිකුරාද | ... 21.02.75 | සිකුරාද | දවල් 12.00 |
| මාර්තු | ... 07.03.75 | සිකුරාද | ... 28.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද | ... 07.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද | ... 14.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | ... 21.03.75 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... 04.04.75 | සිකුරාද | ... 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද | ... 04.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද | ... 11.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | ... 18.04.75 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | ... 02.05.75 | සිකුරාද | ... 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද | ... 02.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද | ... 09.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද | ... 16.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද | ... 23.05.75 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | ... 06.06.75 | සිකුරාද | ... 30.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද | ... 06.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද | ... 13.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද | ... 20.06.75 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී